# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

**Business Studies**

නිපුණතාව 18.0 :
ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා හා පුළුල් කිරීම සඳහා ව්‍යාපාර සැලසුමක් පිළියෙළ කරයි.

## ව්‍යාපාර සැලැස්ම

**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**

**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය : ඒ.ඒ. හිමාලි අබේසිංහ මිය**

**ර/ විද්‍යාලෝක මහා විද්‍යාලය**

**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

# 18. පාඩම : ව්‍යාපාර සැලැස්ම




**සැකසුම** : ඒ.ඒ. හිමාලි අබේසිංහ

BBA ( 2nd Upper)

රුහුණු විශ්ව විද්‍යාලය

PGDE (merit)

ජාතික අධ්‍යාපන ආයතනය

**නිපුණතාවය 18**. ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා හා පුළුල් කිරීම සඳහා ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කරයි.

**නිපුණතා මට්ටම් :**

18.1 ව්‍යාපාර සැලැස්මක මූලිකාංග විමසමින් ව්‍යාපාර අදහසට උචිත ව්‍යාපාර සැලැස්මක් ප්‍රදර්ශනය කරයි.

18. 2 ව්‍යාපාර අදහසට උචිත අලෙවි සැලැස්ම පිළියෙල කරයි.

18.3 අලෙවි සැලැස්ම අනුව මෙහෙයුම් සැලැස්ම පිළියෙල කරයි.

18.4 ව්‍යාපාරයේ මානව සම්පත් සැලැස්ම පිළයෙල කරයි.

18.5 ව්‍යාපාරයේ මූල්‍ය සැලැස්ම පිළියෙල කරයි.

18.6 ව්‍යාපාර සැලැස්ම අනුව ව්‍යාපාරයේ ශක්‍යතාව අගයයි.

18.7 විධායක සාරාංශය පිළියෙල කරයි.

### ව්‍යාපාර අදහස

පුද්ගලයකුගේ හෝ සංවිධානයක අවශ්‍යතාවක් හෝ උවමනාවක් ඉටු කළ හෝ හැකි නිෂ්පාදිතයක් පිළිබඳ ඇති වන සිතුවිල්ල ***ව්‍යාපාර අදහසක්*** ලෙස හැඳින් වේ.

එම ව්‍යාපාර අදහස සාර්ව හා සූක්ෂ්ම විශ්ලේෂණය මගින් ව්‍යාපාර අවස්ථාවක් තීරණය කළ යුතුය.

### සාර්ව විශ්ලේෂණය :

ව්‍යාපාර අදහස් සියල්ල අතුරින් යෝග්‍ය ව්‍යාපාර අදහස හඳුනා ගැනීම සඳහා සියළු ම අදහස් ඇගයීමට ලක් කිරීම සාර්ව විශ්ලේෂණය ලෙස හැඳින්වේ.මෙහි දී ව්‍යාපාරයේ බාහිර පරිසර සාධක ඇගයීම් කළ යුතු ය

### ප්‍රශ්නය :

- සාර්ව පරිසර සාධක නම් කරන්න.

  ..........................................................................................................

  ..........................................................................................................

**සූක්ෂ්ම විශ්ලේෂණය** :

සාර්ව විශ්ලේෂණය මගින් හඳුනා ගත් ව්‍යාපාර අදහස අතුරින් ව්‍යවසායකයාට වඩාත් ප්‍රතිලාභ ගෙන දෙන ව්‍යාපාර අදහස තෝරා ගැනීම සඳහා එම ව්‍යාපාර අදහස සූක්ෂ්ම විශ්ලේෂණයකට භාජනය කෙරේ. මෙහි දී අභ්‍යන්තර හා ආසන්න පරිසර සාධක අනුව ඇගයීමක් කළ යුතු ය.

| අභ්‍යන්තර පරිසර සාධක | ආසන්න පරිසර සාධක |
|---|---|
| | |

# <u>ව්‍යාපාර සැලැස්ම</u>

ව්‍යාපාර සැලැස්ම යනු පවතින හෝ නව ව්‍යාපාරය පිළිබඳ ඇල්මැති පාර්ශවයන්ට ව්‍යාපාරයේ අනාගත වැඩපිළිවෙල පිළිබඳව ඉදිරිපත් කරන ලිඛිත ලියවිල්ලයි.

ප්‍රශ්නය :

ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ වැදගත්කම් ලියන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

## <u>ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු</u>

1. පැහැදිලි ඉම (focus)
2. ගනුදෙනුකරුවෝ (customers)
3. ඉලක්ක (targets)
4. අවශ්‍ය මූල්‍ය සම්පත් (financial resources)

## ව්‍යාපාර සැලැස්මක අඩංගු මූලිකාංග

1. පිට කවරය / මුල් පිටුව
2. පටුන
3. විධායක සාරාංශය
4. ව්‍යාපාර විස්තරය / සමාගම් සාරාංශය
5. මෙහෙයුම් සැලැස්ම
6. අලෙවිකරන සැලැස්ම
7. මානව සම්පත් සැලැස්ම
8. මූල්‍ය සැලැස්ම
9. උප ග්‍රන්ථ / ඇමුණුම්

## ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත කරුණු පැහැදිලි කිරීම

## 1.මුල් පිටුව :

ව්‍යාපාරයකට සුවිශේෂ වූ අනන්‍යතාව මුල් පිටුවෙන් ඉදිරිපත් කළ හැකි ය. ව්‍යාපාරයකට හඳුනා ගැනීමට සංකේත ඇතුළත් කිරීමට උචිත ස්ථානය මුල් පිටුව යි. ව්‍යාපාරය හඳුනා ගැනීමට අදාළ තොරතුරු ( ලිපියොමුව, දුරකථන අංක, ෆැක්ස්, වෙබ් අඩවිය) මුල් පිටුවේ ඇතුළත් කළ යුතු ය. සැලැස්ම පිළිබඳ කිසියම් ප්‍රශ්නයක් හෝ තොරතුරක් හෝ සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කළ යුතු පුද්ගලයාගේ නම මෙහි ඇතුළත් කළ යුතු ය.

**2.**විධායක සාරාංශය :

ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූලික කරුණු සංක්ෂිප්ත කොට දක්වන කොටස විධායක සාරාංශය ලෙස හැඳින් වේ. සැලැස්ම කියවන්නාට සමස්ත සැලැස්ම පිළබඳ දළ අවබෝධයක් ලබාදෙන කොටස මෙය වන අතර මෙය සැමවිට ම කෙටි හා ආකර්ශණීය විය යුතු ය.

**3.** ව්‍යාපාර විස්තරය :

ව්‍යාපාරය කුමක් ද යන්න හා ව්‍යාපාරය සපයනු ලබන භාණ්ඩ හෝ සේවාව පිළිබඳ විස්තරත් එමගින් ගණුදෙනුරුවන්ට ලැබෙන ප්‍රතිලාභත්, එහි සුවිශේෂත්වය විස්තර කෙරෙන කොටසයි. එහි පහත සඳහන් තොරතුරු ඇතුළත් කෙරේ.

- ව්‍යාපාරයේ නම හා ලිපිනය
- වර්ෂයේ අරමුණු හා පරමාර්ථ
- ආදි කර්තෘවරු
- සංවිධාන ව්‍යුහය
- සංවිධාන ක්‍රමය
- අධ්‍යක්ෂ මණ්ඩලය
- භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර

**4.**අලෙවිකරණ සැලැස්ම

වෙළෙඳපොල තරඟකාරිත්වය, අලෙවි උපාය මාර්ග, විකුණුම් පුරෝකථනය ආදී තොරතුරු සවිස්තරාත්මක ව ඉදිරිපත් කරන කොටස අලෙවි සැලැස්ම වේ.

**5.**මෙහෙයුම් සැලැස්ම :

නිෂ්පාදන ක්‍රියාපටිපාටි, නිෂ්පාදන යන්ත්‍ර සහ උපකරණ, අවශ්‍ය නිෂ්පාදන ප්‍රමාණය, කර්මාන්ත ශාලාව ස්ථාගත කිරීම, නිෂ්පාදනයේ දී අනුගමනය කරන ජාතික හා අන්තර්ජාතික ප්‍රමිති ආදී විස්තර ඇතුළත් කෙරෙන කොටස මෙහෙයුම් සැලැස්ම ලෙස හඳුන්වයි.

**6.**මානව සම්පත් සැලැස්ම:

ආයතනයක අනාගත මානව සම්පත් අවශ්‍යතා නිශ්චය කිරීමත්, එහි අවශ්‍යතා ඉටුකර ගත්තා ආකාරයත් ඇතුළත් කෙරෙන කොටස මානව සම්පත් සැලැස්ම වේ.

**7.**මූල්‍ය සැලැස්ම

ව්‍යාපාරයක සියළු ඇස්තාමේන්තුගත මූල්‍ය තොරතුරු ඇතුළත් වන කොටස මූල්‍ය සැලැස්ම වේ.

**8.**ඇමුණුම් :

ව්‍යාපාර සැලැස්ම අවසානයේ ඉදිරිපත් කළ යුතු තොරතුරු

- රූප සටහන්
- ප්‍රස්තාර සහ වගු
- දත්ත වාර්තා
- ජීව දත්ත විස්තර
- අනුපාත

විභාග ප්‍රශ්න :

2019/11/8/(iii) (අ)

- ව්‍යාපාරිකයකුට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 1x2 = ලකුණු 02)

## ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ දී සැළකිලිමත් විය යුතු කරුණු

මෙහි දී විශේෂ අවධානය යොමු කළ යුතු තරුණු ලෙස,

- සිත් ඇද ගන්නා නිමාවකින් යුතුව මුල් පිටුව සැකසීම. මුල් පිටුවේ ආයතනයේ නම, ලිපි යොමුව, දුරකථන අංක E-mail යොමුව අදිය සඳහන් කළ යුතු ය.
- පටුන නිවැරදි පිටු අංක සහිත ව මනා ව ඉදිරිපත් කිරීම.
- හොඳ කඩදාසියක මුද්‍රණය කර ඉදිරිපත් කිරීම.
- වැඩි දුරටත් විස්තර කළ යුතු කරුණු ඇතොත් ඒවා ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කිරීම.
- වැදගත් තොරතුරු මතුකර දැක්වීම.
- සෑම ප්‍රධාන මාතෘකාවක් ම නව පිටුවකින් ආරම්භ කිරීම.
- වගු යොදන විට හිස්තැන් නොමැතිව සැකසීම.
- සියල වගු අංක, මාතෘකා හා දත්ත මූලාශ්‍ර දක්වා තිබීම
- අංක භාවිතය අනුපිළිවෙලින් යෙදීම.
- දැකුම්කළු පොත් පිංචක් ලෙස සැකසීම

# අලෙවිකරණ සැලැස්ම

වෙළෙඳපොල , තරඟකාරිත්වය, අලෙවි උපාය මාර්ග, විකුණුම් පුරෝකථන ආදී තොරතුරු සවිස්තර ව ඉදිරිපත් කරන කොටස අලෙවිකරණ සැලැස්මයි.

මෙවැනි සැලැස්මක් පහත සඳහන් හේතු නිසා වැදගත්වේ.

- නිෂ්පාදිත සඳහා ප්‍රමාණවත් හා වර්ධනය වන වෙළෙඳපොලක් ඇතිබව පෙන්වා දීමට
- වෙළෙඳපොලේ තරඟකාරිත්වයට මුහුණ දිය හැකි බව පෙන්වා දීමට

## අලෙවිකරණ සැලැස්මක ඇතුළත් කරුණු

- ❖ කර්මාන්තය හා වෙළෙඳපොල විශ්ලේෂණය
- ❖ අලෙවි කිරීමට අපේක්ෂිත භාණ්ඩය හෝ සේවාව
- ❖ ඉලක්ක වෙළෙඳපොල
- ❖ තරඟකාරිත්ව විශ්ලේෂණය
- ❖ අපේක්ෂිත අලෙවිය
- ❖ තරඟකරුවන්ගේ අලෙවි උපාය මාර්ග
- ❖ යෝජිත අලෙවි උපාය මාර්ග
- ❖ නිෂ්පාදිත උපාය මාර්ග
- ❖ මිල උපාය මාර්ග
- ❖ බෙදා හැරීමේ උපාය මාර්ග
- ❖ ප්‍රවර්ධන උපාය මාර්ග
- ❖ වාර්ෂික විකුණුම් පුරෝකථනය
- ❖ අලෙවි වියදම්

කර්මාන්ත හා වෙළෙඳපොල විශ්ලේෂණය:

මෙහි දී අදාළ කර්මාන්තය පිළිබඳ ව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කෙරෙයි. කර්මාතයේ වර්තමාන තත්ත්වය,විකුණුම් ලාභ, වර්ධන අනුපාත හා වෙනත් ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණයක් සිදු කෙරෙයි.

- ගැනුම් කරුවෝ කවුරු ද?
- වෙළෙඳපොල ප්‍රාදේශීය ද, ජාතික ද,අන්තර්ජාතික ද ආදී වශයෙන්.

නිෂ්පාදිතය:

අලෙවි කිරීමට අපේක්ෂිත නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක් වේ.

- භාණ්ඩය හෝ සේවාව
- නිෂ්පාදිත මිශ්‍රය (දිග , පළල,ගැඹුර පිළිබඳ විස්තර)
- නිෂ්පාදිතවල ප්‍රයෝජ්‍යතාව
- ඒ ඒ නිෂ්පාදිතයේ මෝස්තරය, ප්‍රමාණය,වර්ගය

ඉලක්ක වෙළෙඳපොල :

මේ පිළිබඳව ඉදිරිපත් කළ යුතු කරුණු කිහිපයක් පහත දැක් වේ.

- ඉලක්ක වෙළෙඳපොල හා එහි ඛණ්ඩණවල සුවිශේෂ ලක්ෂණ
- ඉලක්ක වෙළෙඳපොලේ මූලික ප්‍රවණතා අපේක්ෂිත ප්‍රවණතා හා අපේක්ෂිත වෙනස්කම්
- ඉලක්ක වෙළෙඳපොලට ළඟා වීමේ උපාය මාර්ග

තරඟකාරිත්ව විශ්ලේෂණය

- පවත්නා තරඟකාරිත්වය
- තරඟකරුවෝ හා ඔවුන්ගේ ශක්ති
- තරඟකාරිත්වයට මුහුණ දීමට තමා සතු ශක්ති හා දුර්වලතා
- වෙළෙඳපොලට පිවිසීමට ඇති බාධා, එනම් පිරිවැය කාලය තාක්ෂණය , පේටන්ට් බලපත්‍ර හා වෙළෙඳ ලකුණ ආදිය

අපේක්ෂිත අලෙවිය පිළිබඳ ඉදිරිපත් කළ යුතු තොරතුරු :

ඉලක්ක වෙළදපොල ප්‍රමාණය , අපේක්ෂිත ගනුදෙනුකරුවන් ප්‍රමාණය හා ඔවුන්ගේ මිල දී ගැනීමේ හැකියාව, අපේක්ෂිත වෙළෙඳපොල වර්ධනය ආදිය.

## තරඟකරුවන්ගේ අලෙවි උපාය මාර්ග :

තරඟකරුවන්ගේ මිල උපාය මාර්ග, බෙදාහැරීමේ උපාය මාර්ග හා ප්‍රවර්ධන උපාය මාර්ග පිළිබඳ විස්තර මෙහි ඇතුළත් කෙරේ.

## යෝජිත අලෙවි උපාය මාර්ග

- නිෂ්පාදිත උපාය මාර්ග
- මිල උපාය මාර්ග
- බෙදාහැරීමේ උපාය මාර්ග
- ප්‍රවර්ධන උපාය මාර්ග

## විකුණුම් පුරෝකථනය :

නිෂ්පාදිත වර්ගය, විකුණුම් ප්‍රමාණය, ඒකකයක මිල, වාර්ෂික ආදායම ආදී තොරතුරු කිහිපයක් පහත දැක් වේ.

- අලෙවි වියදම්
- බෙදාහැරීමේ වියදම්, වට්ටම්, ප්‍රවර්ධන වියදම්, විකුණුම් කොමිස් , අලෙවිය සඳහා යොදාගත් ස්ථාවර වත්කම් ක්ෂය වීම් ආදී තොරතුරු ඇතුළත්විය යුතු ය.

❖ ඉස්සන් මගුරන් ..........ගීතය ඇසුරින් පහත අලෙවි සංකල්ප පැහැදිලි කරන්න.

ගුණාත්වය -....................................................................................................

මිල - ...............................................................................................

ස්ථානය - ...............................................................................................

ප්‍රවර්ධන උපක්‍රම - ...............................................................................

...............................................................................................

...............................................................................................

භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ හැකියාව හා පුරුදු - ....................................

අලෙවි සැලැස්ම

# අලෙවි සැලැස්ම

1. අලෙවි කිරීමට අපේක්ෂිත නිෂ්පාදිත පිළිබඳ විස්තර :
   ඔබගේ නිෂ්පාදිත සම්බන්ධයෙන් වර්ගය ,මෝස්තරය, ගැඹුර,ගුණත්වය ආදී පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
   ------------------------------------------------------------------------------------------------
   ------------------------------------------------------------------------------------------------
   --------------------------------------------------------------------------------

**2. ඉලක්ක වෙළෙඳපොල**

| **නිෂ්පාදිත** | **ඉලක්ක ගනුදෙනුකරුවෝ** |
|---|---|
| | |

❖ **තරඟකාරිත්ව විශ්ලේෂණය**

| පවත්නා තරඟකරුවන් | ඔවුන්ගේ ශක්තීන් | ඔවුන්ගේ දුර්වලතා |
|---|---|---|
| | | |

❖ **තරඟකාරිත්වයට මුහුණ දීමට තමා සතු**

| **ශක්ති** | **දුර්වලතා** |
|---|---|
| | |

❖ අලෙවි උපාය මාර්ග

| අලෙවි මිශ්‍රය | තරඟකරුවන්ගේ උපාය මාර්ග | ව්‍යාපාරිකයාගේ උපාය මාර්ග |
|---|---|---|
| නිෂ්පාදිතය | | |
| මිල | | |
| ස්ථානය | | |
| ප්‍රවර්ධනය | | |
| | | |

❖ **වාර්ෂික විකුණුම් ආදායම් හා වියදම් පුරෝකථනය**
**වර්ෂයක් සඳහා පමණක් සකස් කරන්න**

| නිෂ්පාදිත වර්ගය/ වර්ග | අපේක්ෂිත විකුණුම් | ඒකකයක මිල | විකුණුම් ආදායම | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| 1.<br>2.<br>3. | | | | |
| මුළු විකුණුම් ආදායම | | | | |
| අපේක්ෂිත අලෙවි වියදම්<br>බෙදා හැරීමේ<br>ප්‍රචාරණය<br>ක්ෂය වීම්<br>(බෙදාහැරීමේ රථ)<br>විකුණුම් කොමිස්<br>මුළු අලෙවි වියදම් | | | | |
| | | | | |

විභාග ප්‍රශ්න :

- **2018/11/(8)/(iii)**

  ව්‍යාපාර සැලැස්මේ අලෙවි සැලසුමට ඇතුළත් කළ යුතු ප්‍රධාන උපාය මාර්ග මොනවා ද?

- **2019/11/(8)/(iv)/(ආ)**

  අලෙවිකරණ සැලැස්මක ඇතුළත් වියයුතු මූලිකාංග විස්තර කරත්ත.

# <u>මෙහෙයුම් සැලැස්ම</u>

**කිසියම් නිෂ්පාදිතයක් බිහිකිරීමේ දී එම නිෂ්පාදනයට අදාළ ක්‍රියා පටිපාටි, නිෂ්පාදන ප්‍රමාණය, නිෂ්පාදන පිරිවැය, භාවිත කරන ජාතික හා අන්තර්ජාතික ප්‍රමිති, නිෂ්පාදන යන්ත්‍රෝපකරණ, කර්මාන්ත ශාලාව ස්ථානගත කිරීම ආදී විස්තර ඇතුළත් කෙරෙක කොටස මෙහෙයුම් සැලැස්ම ලෙස හඳුන්වයි.**

## මෙහෙයුම් සැලැස්මක් වැදගත් වීමට හේතු

- ඉදිරි මෙහෙයුම් කටයුතු පිළිබඳ ව කල් කබා අවබෝධයක් ලබා ගත හැකි වීම.
- නිෂ්පාදිතයේ ගුණත්වය ඉහල නංවාගත හැකිවීම.
- නිෂ්පාදන කාර්යයේදී ඇතිවන අපතේ යෑම්, ප්‍රමාද වීම් අවම කරගත හැකි වීම
- නිෂ්පාදින ඒකකයක පිරිවැය කල්තබා නිශ්චය කරගත හැකිවීම

## මෙහෙයුම් සැලැස්මක අන්තර්ගත විය යුතු (අංග) කරුණු:

- ස්ථාවර වත්කම් අවශ්‍යතාව
- අමුද්‍රව්‍ය අවශ්‍යතාව
- සේවක අවශ්‍යතාව
- නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය
- කර්මාන්තශාලා බිම් සැලැස්ම
- අපද්‍රව්‍ය බැහැර කිරීම
- සමාජයීය හා පාරිසරික බලපෑම්
- මුළු නිෂ්පාදන පිරිවැය හා ඒකක පිරිවැය
- ව්‍යාපාර ය ආරම්භ කිරීමට පෙර මෙහෙයුම් කාර්ය වියදම්

## නිෂ්පාදන ධාරිතාව :

- නිශ්චිත කාලච්ඡේදයකදී නිෂ්පාදන ක්‍රියාවලියේ භාවිත කරන යෙදවුම් අනුව ලබාගත හැකි උපරිම නිෂ්පාදන ඒකක ප්‍රමාණය යි.

ස්ථාවර වත්කම් අවශ්‍යතාව :

- නිෂ්පාදන ක්‍රියාවලියේ දී භාවිත කරන ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ, මෝටර් රථ ආදී වත්කම් සම්බන්ධයෙන් දැරීමට සිදුවන පිරිවැය හා එම වත්කම්වලට අදාළ ක්ෂයවීම මෙයට ඇතුළත් වේ.

අමුද්‍රව්‍ය අවශ්‍යතාව :

- නිෂ්පාදනය කිරීමට බලාපොරුත්තු වන ඒකක ප්‍රමාණය, ඒ අනුව අවශ්‍ය වන අමුද්‍රව්‍ය ප්‍රමාණය ඒ සඳහා දැරීමට සිදුවන පිරිවැය ආදී තොරතුරු මෙහි දී දැක්විය හැකිය.

සේවක අවශ්‍යතාව :

- නිෂ්පාදන කටයුතු කිරීමට මැදිහත් වන කළමනාකරුවන් හා සේවකයන් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් කිරීම. එනම් අවශ්‍ය කෙරෙන සේවක සංඛ්‍යාව, සේවකයින්ගේ ස්වභාවය, ඔවුන්ට ගෙවනු ලබන පරිශ්‍රමික ආදී තොරතුරු මෙහි ඇතුළත් තෙරේ.

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය

- නිෂ්පාදන කටයුතුවලට අදාළ ව දැරීමට සිදුවන නමුත් නිෂ්පාදන ඒකකයකට ඍජුව ම වෙන් කර හඳුනා ගත නොහැකි, පොදුවේ දරන පිරිවැය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වේ. මේවා කම්හල් පොදුකාර්ය පිරිවැය ලෙස ද හැඳින් වේ. ඒ අනුව නිෂ්පාදන කටයුතු සඳහා දැරීමට සිදුවන වක්‍ර ද්‍රව්‍ය පිරිවැය, වක්‍ර ශ්‍රම පිරිවැය සහ වෙනත් වක්‍ර වියදම් හඳුනාගෙන මෙහි දී ඇතුළත් කෙරේ.

කර්මාන්තශාලා පිරියත සැලැස්ම :

- නිෂ්පාදනයට භාවිත කරන යන්ත්‍ර උපකරණ හා සවිකිරීම් ස්ථානගත කළ යුතු අකාරය පිළිබඳ ව ඉදිරිපත් කරන සැලැස්ම කර්මාන්තශාලා පිරියත සැලැස්ම වේ.

අපද්‍රව්‍ය බැහැර කිරීම

- නිෂ්පාදන ක්‍රියාවලියේ දී ඇතිවන අපද්‍රව්‍ය බැහැර කිරීමේ දී දැරීමට සිදුවන් පිරිවැය සම්බන්ධ දත්ත හා තොරතුරු ඇතුළත් කෙරේ.


**සමාජීය හා පාරිසරික බලපෑම**

- **නිෂ්පාදන ක්‍රියාවලිය නිසා සමාජයට හා පරිසරයට සිදුකරන අහිතකර බලපෑම අවම කිරීමට ගෙන ඇති ක්‍රියා මාර්ග හා ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය මෙහි සඳහන් කෙරේ.**

**මුළු නිෂ්පාදන පිරිවැය හා ඒකක පිරිවැය :**

- **නිශ්චිත කාලච්ඡේදයක් තුළ නිපදවීමට බලාපොරුත්තු වන භාණ්ඩ හෝ සේවා හෝ දැරීමට සිදුවේ යැයි අපේක්ෂිත වියදම්වල එකතුව මුළු නිෂ්පාදන පිරිවැය වේ. මුළු නිෂ්පාදන පිරිවැය ඍජු හා වක්‍ර ලෙස වර්ග කෙරේ.**

- **පහත සටහන සම්පූර්ණ කරන්න.**



**ඒකක නිෂ්පාදන පිරිවැය = ________________________________**

## ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර මෙහෙයුම් කාර්යන් හා වියදම්

- **ඕනෑම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර ඒ සඳහා සම්පූර්ණ කළ යුතු කාර්යන් හා දැරිය යුතු වියදම් පවතී. එමෙන් ම ව්‍යාපාරය ආරම්භ නිරීමට පෙර ද ව්‍යවසායකයා කළ යුතු කාර්යයන් හා ඒ සඳහා දැරිය යුතු වියදම් වේ. එනම්,**

  - ❖ **පර්යේෂණ කටයුතු සිදු කිරීම හා සම්බන්ධ වියදම්.**
  - ❖ **ව්‍යාපාර ලියාපදිංචි කිරීම සඳහා දැරීමට සිදුවන පිරිවැය.**
  - ❖ **ප්‍රාග්ධනය සම්පාදනය සඳහා දැරීමට සිදුවන පිරිවැය.**
  - ❖ **අවශ්‍යවන ජංගම නොවන වත්කම් අත්පත්කර ගැනීමේ දී සිදුවන පිරිවැය.**

**ක්‍රියාකාරකම :**

නව ව්‍යාපාරයක් ආරම්භ කළ “ප්‍රතිභා ” ව්‍යාපාරයේ වියදම් කිහිපයක් පහත දැක්වේ. ඒවා ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර වියදම් නම් ‘ නි ‘ද එසේ නොවේනම්’ වැ’ ද ඉදිරියෙන් යොදන්න

1. වෙළෙඳපොළ සමීක්ෂණය සඳහා ABC සමාගමට රු. 25 000ක් ගෙවීම. ( )
2. කාර්යාලයට ලී බඩු මිලදී ගත්තා රු. 60 000. ( )
3. බලපත්‍ර සඳහා ප්‍රාදේශීය සභාවට ගෙව්වා රු. 4 500. ( )
4. ගොඩනැගිලි පිරිසිදු කිරීමට ගෙව්වා රු. 5 000. ( )
5. විදුලි සැපයීම ලබා ගැනීම සඳහා පරිශ්‍රය සකස්කර ගැනීමට රු 4 000 ක්ගෙව්වා. ( )
6. පරිගණක ජාලයේ රැහැන් ඇදීමේ ගාස්තුව රු. 8 000. ( )
7. පරිගණක යන්ත්‍ර 10 ක් මිල දී ගත්තා රු. 800 000. ( )
8. ව්‍යාපාර සැලැස්ම සැකසීම වෙනුවෙන් ගෙව්වා රු. 20 000. ( )
9. ව්‍යාපාරය ආරම්භ දිනයේ සංග්‍රහ වියදම් රු. 8 500. ( )
10. සැපයුම් කරුවන් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා වූ වියදම් රු. 1 000 ( )

# <u>මෙහෙයුම් සැලැස්ම</u>

**නිෂ්පාදන ධාරිතාව :**

**නිෂ්පාදිතය** [ ] **:**

**ප්‍රමාණය :**

| වර්ෂය | ප්‍රමාණය - ඒකක |
|---|---|
| 1 වන වර්ෂය | |
| 2 වන වර්ෂය | |
| 3 වන වර්ෂය | |

- **ද්‍රව්‍ය හා සේවක අවශ්‍යතා (වර්ෂයක් සඳහා පමණි)**

| | ප්‍රමාණය | ඒකක මිල<br>රු. ශත |
|---|---|---|
| ස්ථාවර වත්කම්<br>………………………………………………<br>………………………………………………<br>…………………………………… | ……………………………<br>……………………………<br>…………………………… | ……………………………<br>……………………………<br>…………………………… |
| | **ප්‍රමාණය** | **කිලෝවක මිල** |
| අමුද්‍රව්‍ය (1 වරෂයක් සඳහා පමණක්)<br>………………………………………………<br>………………………………………………<br>…………………………… | ……………………………<br>……………………………<br>…………………………… | ……………………………<br>……………………………<br>…………………………… |
| | **ප්‍රමාණය** | **මාසික වැටුප** |
| සේවකයන්<br>(1 වර්ෂයක් සඳහා පමණක්)<br>මෙහෙයුම් කළමනාකරු<br>1. සේවක<br>2. සේවක<br>3. …………………………… | ……………………………<br>……………………………<br>……………………………<br>…………………………… | ……………………………<br>……………………………<br>……………………………<br>…………………………… |

- **කර්මාන්ශාලා බිම් සැලැස්ම**

**මෙහෙයුම් පිරියත සැලසුම් කර ඇති ආකාරය මෙහි ඇඳ දක්වන්න. ඒ සඳහා උචිත පිරියත සැලසුම් වර්ගයක් භාවිත කරන්න.**

| |
|---|
| |

- **අපද්‍රව්‍ය බැහැර කිරීම**
- **අපද්‍රව්‍ය පැහැර කිරීම සඳහා අපේක්ෂිත ක්‍රියාමාර්ග කෙටියෙන් දක්වන්න.**
- **ඒ සඳහා දැරීමට සිදුවන් පිරිවැය ද ඇස්තමේන්තු කරන්න.**

| අපේක්ෂිත ක්‍රියාමාර්ග | අපේක්ෂිත පිරිවැය<br>රු. ශත |
|---|---|
| 1. ...........................................................<br>2. ...........................................................<br>3. ........................................................... | ..................... ...........<br>..................... ...........<br>..................... ........... |
| මුළු පිරිවැය | ..................... ........... |

- **සමාජීය හා පිරියත සැලැස්ම**

**නිෂ්පාදන ක්‍රියාවලිය නිසා සමාජයට හා පරිසරයට බලපෑම නිසා සිදුවන අහිතකර බලපෑම අවම කිරීමට ගෙන අති ක්‍රියා මාර්ග හා ඒ සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය මෙහි සඳහන් කරන්න.**

| ක්‍රියා මාර්ග | අපේක්ෂිත පිරිවැය<br>රු. ශත |
|---|---|
| 1. ................................................<br>2. ................................................ | .................... .........<br>.................... ......... |
| මුළු පිරිවැය | .................... ......... |

- නිෂ්පාදන පිරියත සැලැස්ම (1 වර්ෂයක් සඳහා පමණි)

| | | රු. ශත | රු. ශත |
|---|---|---|---|
| අපේක්ෂිි ඒකක ප්‍රමාණය | | | ...................... |
| සෘජු ද්‍රව්‍ය පිරිවැය | | | |
| ................................... | ................. | | |
| .................................. | ................. | | |
| ................................... | ................ | .................... | |
| සෘජු ශ්‍රම පිරිවැය | | | |
| ................................... | ................. | | |
| ................................... | ................ | | |
| ................................... | ................ | .................... | |
| සෘජු වෙනත් පිරිවැය | | | |
| .................................. | ................ | | |
| ................................... | ................ | | |
| ................................... | ................ | ................... | |
| මුළු සෘජු පිරිවැය | | | |
| ................................... | ................ | | |
| ................................... | ................ | | |
| ................................... | ................ | .................... | |
| පොදු කාර්ය පිරිවැය | | | |
| ................................... | ................ | | |
| ................................... | ................ | | |
| ................................... | ................ | .................... | |
| වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | | | |
| ................................... | ............... | | |
| ................................... | ............... | | |
| .................................. | ............... | .................... | |
| වක්‍ර ශ්‍රම පිරිවැය | | | |
| ................................... | .............. | | |
| .................................. | ............... | | |
| .................................. | ............... | ................... | |
| වක්‍ර වෙනත් පිරිවැය | | | |
| ................................. | ................ | | |
| ................................. | ................ | .................... | |
| .................................. | ............... | | |
| පොදු කාර්ය පිරිවැය | | | ...................... |
| මුළු නිෂ්පාදන පිරිවැය | | | ..................... |

නිෂ්පාදන ඒකක පිරිවැය - රු. [ ]

සැ.යු :ඇස්තමේන්තු කළ ස්ථාවර වත්කම් පිරිවැයෙන් 10% ක් 1 වර්ෂය සඳහා අදාළ කර

විභාග ප්‍රශ්න :

- **2017/11/(8)/(v)/(ආ)**

වත්‍යාපාර සැලැස්මක අංගයක් ලෙස මෙහෙයුම් සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතා හතරක් සඳහන් කරන්න.

- **2018/1/(30)**

ව්‍යාපාර සැලසුමක අංගයක් නිවැරදිව විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න

**(1)** තරඟකාරී හා වෙළෙඳපොල අත්පත් කර ගැනීමේ හා (විනිවිදයාමේ) උපාය මාර්ග අඩංගු වන්නේ නිෂ්පාදන සැලසුමෙහි ය.

**(2)** අවශ්‍ය සම්පත් ප්‍රමාණය හා නිෂ්පාදන ප්‍රමිති අඩංගු වන්නේ මෙහෙයුම් සැලැස්මෙහි ය.

**(3)** අවශ්‍ය මානව සම්පත් අඩංගු වන්නේ මූල්‍ය සැලැස්මෙහි ය.

**(4)** අවශ්‍ය සියළු ම ඇස්තමේන්තුගත තොරතුරු අඩංගු වන්නේ අලෙවි සැලැස්මෙහි ය.

**(5)** ව්‍යාපාරයේ උපාය මාර්ග හා සංවිධාන ව්‍යුහය විස්තර කෙරෙන්නේ මානව සම්පත් සැලැස්මෙහි ය.

- **2019/11/(8)/(v)**

ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය තුළ අඩංගු මෙහෙයුම් පෙර වියදම් යන්න පැහැදිලි කර , ඒ සඳහා උදාහරණ දෙකක් ලියන්න.

# මානව සම්පත් සැලැස්ම

ව්‍යාපාරයක අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස අනාගත මානව සම්පත් අවශ්‍යතා නිශ්චය කරමින් ඒ සඳහා අදාළ පිරිවැයක් ඇස්තමේන්තු කොට සකසනු ලබන සැලැස්ම මානව සම්පත් සැලැස්ම ලෙස හැඳින් වේ.

මානව සම්පත් සැලැස්මක් වැදගත් වීමට බලපෑ හේතු කිහිපයකි.

- ආයතනයක සේවක අවශ්‍යතා හා පිරිවැය පුරෝකථනය කළ හැකි වීම.
- මානව සම්පත වඩා කාර්්‍යක්ෂම ව හා ඵලදායී ලෙස යොදාගත හැකිවීම.
- අනාගත සේවක අවශ්‍යතා කලින් හඳුනා ගැනීමෙන් ව්‍යාපාර කටයුතු අඩපන වී යාම
- හදිසි බඳවා ගැනීම සඳහා දැරීමට සිදු විය හැකි පිරිවැය අවම කරගත හැකිවීම
- සේවකයින්ගේ පුහුණු හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට හැකිවීම.
- ඉහළ නිපුණතාවකින් යුත් සේවකයන් ආකර්ෂණය කර ගැනීමට අවස්ථාව සැලසීම.

## මානව සම්පත් සැලැස්මක ඇතුළත් විය යුතු කරුණු

- ❖ ව්‍යවසායකයන්/හවුල්කරුවන් පිළිබඳ විස්තර
- ❖ කළමනාකරණ කුසලතා
- ❖ සංවිධාන ව්‍යුහයේ මූලික තනතුරු හා වගකීම්
- ❖ සංවිධාන සටහන
- ❖ වාර්ෂික වියදම

❖ ව්‍යවසායකයන්ගේ / හවුල්කරුවන්ගේ විස්තර :

මෙහිදී ව්‍යවසායකයන්/හවුල්කරුවන්ගේ පෞද්ගලික තොරතුරු, නම,ලිපියොමුව ආදිය සඳහන් කළ යුතුයි. මෙහිදී සංවිධානයක කළමනකරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා ශක්ති පිළිබඳ වෙන් වෙන් ව සඳහන් කළ යුතු ය.

❖ සංවිධාන ව්‍යුහයේ තනතුරු හා වගකීම් :

මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීමේදී සංවිධානයේ විවිධ කාරයයන්ට අදාළ ව තනතුරු ඇති කිරීමත් තනතුරුවලට අදාළ කාර්යයන් බලතල හා වගකීම් දැක්වීම අත්‍යාවශ්‍ය ය.
නිදසුන් :

| තනතුර | කාර්ය | වගකීම් |
|---|---|---|
| ප්‍රධාන විධායක නිලධාරී **(CEO)** | ❖ ව්‍යාපාර කළමනාකරණ කටයුතුවලට අදාළ නීරණ ගැනීම<br>❖ උපක්‍රමික සැලසුම් සම්බන්ධ තීරණ ගැනීම | සමස්ත සංවිධානය ම |

(සංවිධානයේ ස්වභාවය අනුව තනතුරු හා කාර්යභාරය ද වෙනස් වේ.)

❖ සංවිධාන සටහන :
සංවිධානයක විවිධ අංශ හා තනතුරු අතර පවත්නා අන්තර් සම්බන්ධතා සංවිධාන ව්‍යුහය සංවිධාන සටහනකින් සාරාංශ කර දැක්විය හැකි ය.

❖ වාර්ෂික වියදම් :
ව්‍යාපාර ආයතනයක ස්වභාවය අනුව පවතින විවිධ තනතුරු වෙනුවෙන් ගෙවනු ලබන වැටුප් හා වේතන වෙනස් වේ. මානව සම්පත වෙනුවෙන් වාර්ෂික මුළු ශ්‍රම වියදම, ඍජු ශ්‍රම වියදම, ඍජු ශ්‍රම වියදම් හා වක්‍ර වියදම වශයෙන් වාර්ෂික මුළු වශයෙන් ද වෙන් කර හඳුනා ගත හැකි ය.
මෙයට අමතර ව ආයතනයේ සමස්ත කළමනාකරණ වියදම් මෙම සැලැස්මෙහි අන්තර්ගත කළ යුතු යි.

# මානව සම්පත් සැලැස්ම

- **ව්‍යවසායකයන්/හවුල්කරුවන් පිළිබඳ විස්තර :**

**ව්‍යවසායකයන් / හව්ල්කරුවන්ගේ පෞද්ගලික තොරතුරු :**

| නම | ලිපියොමුව |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

- **කළමනාකරන කුසලතා :**

| කළමනාකරුගේ නම | අධ්‍යාපන සුදුසුකම් | පළපුරුද්ද | වෙනත් කුසලතා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |


- **කළමනාකරණ නොවන සේවක කුසලතා :**

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | පළපුරුද්ද | බලතල හා වගකීම් |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

- **සංවිධාන ව්‍යුහයේ මූලික තනතුරු හා වගකීම්**

| තනතුර | කාර්ය | බලතල හා වගකීම් |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

- සංවිධාන සටහන :




- වාර්ෂික වියදම් ඇස්තමේන්තුව :

| අයිතමය | මාසික | වාර්ෂික<br>රු. ශත |
|---|---|---|
| වේතන:<br>කළමනාකරුවන්<br>අලෙවි කළමකාතරු<br>මෙහෙයුම් කළමනාකරු<br>මූල්‍ය කළමතාකරු<br>කළමනාකරණ නොවන සේවකයෝ<br>**1.** ..........................................<br>**2.** මෙහෙයුම් අංශයේ සේවකයෝ<br>3. ..........................................<br>**4** ..........................................<br>5. ..........................................<br>වෙනත් පරිපාලන වියදම්<br>දුරකථන<br>රක්ෂණ<br>ලිපිද්‍රව්‍ය<br>කාර්යාලයීය උපකරණ ක්ෂය | | |
| මුළු වියදම් | | |

# <u>මූල්‍ය සැලැස්ම</u>

**ව්‍යාපාරයක සියලු ම ඇස්තමේන්තු ගත මූල්‍ය තොරතුරු ඇතුළත් වන කොටස මූල්‍ය සැලැස්ම ලෙස හැඳින් වේ.**

**මූල්‍ය සැලැස්මක් සකස් කිරීමේ වැදගත්කම ලෙස,**

- **ව්‍යාපාරයක කටයුතු සඳහා අරමුදල් ප්‍රමාණ නිගමනය කිරීමට හා සම්පාදනය කර ගැනීමට.**
- **ව්‍යාපාරයේ අරමුදල් ආයෝජනය කිරීම පිළිබඳ තීරණ ගැනීමට.**
- **මුදල් ඌනතාවක් ඇතිවිය හැකි කාලය හඳුනා ගෙන ඊට පිළියම් යෙදීමට.**
- **මුදල් අතිරික්තයක් ඇතිවන කාලය හඳුනා ගෙන ඒ මුදල් ඵලදායී කටයුතුවලට යෙදවීමට.**

**මූල්‍ය සැලැස්මක ඇතුළත් කරුණු :**

- ○ **ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය (ප්‍රාග්ධන අවශ්‍යතාව)**
- ○ **ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය**
- ○ **ඇස්තමේන්තුගත මුදල (මුදල් ප්‍රවාහ ප්‍රකාශය)**
- ○ **ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**
- ○ **ණය ආපසු ගෙවීමේ සටහන**

1. **ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය**
    - **තෝරාගත් ව්‍යාපාර අදහසට අනුව ක්‍රියාත්මක කර පවත්වා ගෙන යාමට බලාපොරුත්තු වන ව්‍යාපෘති සඳහා දැරීමට සිදු වන පිරිවැය මේ නමින් හැඳින් වේ.**
    - **ව්‍යාපෘති පිරිවැය පහත දැක්වෙන කොටස්වලින් සමන්විත වේ.**

**i. මුළු ස්ථාවර පිරිවැය.**

**ව්‍යාපාරයක කටයුතු අඛණ්ඩ ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන දිගුකාලීන පැවැත්මක් ඇති වත්කම් සඳහා වන පිරිවැය ස්ථාවර පිරිවැය යි.**

**නිදසුන්:**

- **ඉඩම් හා ගොඩනැගිලි**
- **යන්ත්‍ර සූත්‍ර**
- **රථවාහන**
- **වෙනත් උපකරණ**

ii. මෙහෙයුම් වියදම්

මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පෙර අවශ්‍ය වන වියදම වේ.

නිදසුන් :

- ඉඩම් සංවර්ධනයට
- ජල විදුලි පහසුකම් ලබා ගැනීමට
- බලපත්‍ර ලබාගැනීමට
- ව්‍යාපාර ලියාපදිංචි කිරීමට

iii. මූළු කාරක ප්‍රාග්ධනය :

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා දැරීමට සිදුවන අරමුදල කාරක ප්‍රාග්ධනය වේ.

නිදසුන්:

- අමුද්‍රව්‍ය ලබා ගැනීම (ඍජු පිරිවැය)
- නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය දැරීමට
- පරිපාලන පොදුකාර්ය පිරිවැය
- අලෙවි පොදුකාර්ය පිරිවැය දැරීමට

## 2. ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය

අපේක්ෂිත ආදායම් හා අපේක්ෂිත විකුණූ භාණ්ඩවල පිරිවැය සහ අපේක්ෂිත මෙහෙයුම් වියදම් දැක්වෙන ලේඛනය ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය ලෙස හැඳින් වේ.

❖ ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශනයක ඇතුළත්කරුණු දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.

| අයිතමය | පැහැදිලි කිරීම |
|---|---|
| ................................... | ................................................................ |
| ................................... | ................................................................ |
| ................................... | ................................................................ |
| ................................... | ................................................................ |
| ................................... | ................................................................ |
| ................................... | ................................................................ |
| ................................... | ................................................................ |
| ................................... | ................................................................ |

**ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය :**

යම් අනාගත කාලච්ඡේදයක් තුළ දී ව්‍යාපාරයකට මුදල් ගලා ඒම හා ගලායාම පිළිබඳ ව ඇස්තමේන්තු අතුළත් කර පිළියෙල කරන ලේඛනය ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය වශයෙන් හඳුන්වයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයක යම් කාලච්ඡේදයක මුළු මුදල් ගලා ඒම, මුළු මුදල් ගලා යාම සහ කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය ඇතුළත් කෙරේ.

❖ **ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රවාහයක ඇතුළත් කරුණු තුළින් පහත වගුව සම්පූර්ණ කරන්න.**

❖

| මුදල් ගලා ඒම් | මුදල් ගලා යාම් |
|---|---|
| ............................................. | ............................................. |
| ............................................. | ............................................. |
| ............................................. | ............................................. |
| ............................................. | ............................................. |
| ............................................. | ............................................. |
| ............................................. | ............................................. |
| ............................................. | ............................................. |

**3. ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය :**

යම් අනාගත කාලච්ඡේදයක අවසාන දිනට ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරන ලේඛනය ඇස්තමේන්තුගත **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය** ලෙස හඳුන්වයි.

- **ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක ඇතුළත් කරන කරුණු දක්වන්න**

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

4. **ණය ආපසු ගෙවීමේ සටහන :**
**ව්‍යාපාරය ලබාගත් ණය මුදල හා පොලිය ආපසු ගෙවන ආකාරය ,කාලච්ඡේදය ආරම්භයේ හා අවසානයේ ණය ශේෂය ආදී විස්තර මෙහි ඇතුළත් වේ.**

**නිදසුන් :**

- **ණය හිමියෝ**
- **ගෙවියයුතු වියදම**
- **උපචිත බදු**

**ව්‍යාපෘති සාරාංශය :**

ඇස්තමේන්තුගත පිරිවැය , ආදායම් ප්‍රකාශය , මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ණය ආපසු ගෙවීමේ සටහන, ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ආදියේ දැක්වෙන තොරතුරුවල සාරාංශගත ලේඛනය **ව්‍යාපෘති සාරාංශය** ලෙස හැඳින් වේ.

**සඳරුවන්ගේ " සඳරු" අභ්‍යාස පොත් ව්‍යාපාරය වෙනුවෙන් සැකසූ මුදල සැලැස්ම තොරතුරු පහත දැක් වේ.**

| වියදම් ඇස්තමේන්තුව | රු: |
|---|---|
| මූළ පිරිවැය | **280 000** |
| පරිගණක යන්ත්‍ර | **80 000** |
| ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට | **1 500** |
| අලෙවි පොදුකාර්ය පිරිවැය | **28 000** |
| කඩදාසි කපන යන්ත්‍රය | **150 000** |
| ලී බඩු සවිකිරීම් | **80 000** |
| පරිපාලන පොදුකාර්ය පිරිවැය | **17 000** |
| ජලය විදුලිය ලබා ගැනීමට | **25 000** |
| ව්‍යාපාර සැලැස්ම පිළියෙල කිරීමට | **22 000** |
| අලෙවි රථය | **500 000** |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | **25 000** |

1. නිෂ්පාදන ආයතනයක් ලෙස භාවිත කිරීමට අපේක්ෂිත ව්‍යාපාරයේ අයිතිකරු වන සඳරුවන් මහතාට අයත් ඉඩමේ හා ගොඩනැගිල්ලේ වටිනාකම රු: **2000 0000**කි.
2. අලෙවි රථයක් ලබා ගැනීමට රු: **1000 0000** ක බැංකු ණයක් ලබා ගැනීමට යෝජිත ය.
3. ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා සති **2** ක කාලයකට වියදම් වලට ගැලපෙන මුදලක් අවශ්‍ය බව තක්සේරු කළ මුදල රු: **350 000** ක

# <u>මූල්‍ය සැලැස්ම</u>

ව්‍යාපෘති සැලැස්ම

| අයිතමය | යෝජිත | | මුළු මුදල රු . |
|---|---|---|---|
| | ව්‍යාපාරිකය | බැංකු ණය | |
| ○ ජංගම නොවන වත්කම් | | | |
| • ඉඩම් හා ගොඩනැගිලි | ………… | …………… | …………… |
| • යන්ත්‍ර හා උපකරණ | ………… | …………… | …………… |
| • ලීබඩු හා සවි කිරීම් | ………… | …………… | …………… |
| • මොටර් රථ | ………… | …………… | …………… |
| • ……………………………… | ………… | …………… | …………… |
| ○ ජංගම නොවන වත්කම්වල එකතුව**(A)** | ……… | …………… | …………… |
| ○ මෙහෙයුම් පෙර වියදම් | | | |
| • ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට | ……… | …………… | …………… |
| • ව්‍යාපාර සැලැස්ම පිළියෙල කිරීමට | ……… | …………… | …………… |
| • ජලය හා විදුලිය ලබා ගැනීමට | ……… | …………… | …………… |
| ○ මෙහෙයුම් පෙර වියදම් **(B)** | ……… | …………… | …………… |
| ○ කාරක ප්‍රාග්ධනය | | | |
| • මුළු පිරිවැය | ………… | …………… | …………… |
| • නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | ………… | …………… | …………… |
| • අලෙවි පොදු කාර්ය පිරිවැය | ………… | …………… | …………… |
| • පරිපාලන පොදු කාර්ය පිරිවැය | ……… | …………… | …………… |
| ○ කාරක ප්‍රාග්ධන මුළු එකතුව **(c)** | ……… | …………… | ………… |
| • මුළු ව්‍යාපෘති පිරිවැය **(A)+(B)+(c)** | ……… | …………… | …………… |

පාසල් උපකරණ අලෙවි සැලක් ආරම්භ කිරීමට අපේක්ෂිත හසිතගේ ව්‍යාපාර සැලැස්මෙන් ඉදිරි වර්ෂය සඳහා උපුටා ගත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අයත් තොරතුරු පහත දැක්වේ.ඒ ඇසුරෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරන්න.

| | |
|---|---|
| ව්‍යාපාරයට හසිත යෙදවූ මුදල් | **1000000** |
| ඉඩම් ගොඩනැඟිලි මිල දී ගැනීම් | **1000000** |
| අපේක්ෂිත විකුණුම් ආදායම | **3000000** |
| මුළු සෘජු පිරිවැය | **500000** |
| වෙනත් ස්ථාවර වත්කම් මිල දී ගැනීම | **800000** |
| මෙහෙයුම් පෙර වියදම් | **120000** |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | **145000** |
| ආදායම් බදු ගෙවීම | **10000** |
| බදු ගෙවීම | **50000** |
| පරිපාලන පොදු කාර්ය පිරිවැය | **20000** |
| යන්ත්‍ර මිලදී ගැනීම | **500000** |
| අලෙවි පොදු කාර්ය පිරිවැය | **25000** |
| වෙනත් ගෙවීම් | **100000** |

## ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| අයිතමය | රු. |
|---|---|
| මුදල් ගලා ඒම<br>අයිතිකරුගේ මුදල්<br>විකුණුම් ආදායම | |
| මුළු මුදල් ගලා ඒම **(A)** | |
| අඩු කළා: මුදල් ගලා යාම<br>ඉඩම් හා ගොඩනැගිලි මිල දී ගැනීම<br>යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම<br>වෙනත් ස්ථාවර වත්කම් මිල දී ගැනීම<br>මෙහෙයුම් පෙර වියදම්<br>මුළු සෘජු පිරිවැය<br>නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය<br>අලෙවි පොදු කාර්ය පිරිවැය<br>පරිපාලන පොදු කාර්ය පිරිවැය<br>බදු ගෙවීම්<br>ආදායම් බදු ගෙවීම<br>වෙනත් ගෙවීම<br>............................<br>............................ | |
| මුළු මුදල් ගලා යාම් **(B)** | |
| අවසාන මුදල් ශේෂය **(A) – (B)** | |

පහත දැක්වෙන්නේ "සිරසර" රස කැවිලි ව්‍යාපාරයේ ව්‍යාපාර සැලැස්මේ අඩංගු තොරතුරු ඇසුරින් එහි පළමු වර්ෂය සඳහා අවසන් ප්‍රතිඵලය ගණනය කරන්න.

| <u>අයිතමය</u> | <u>වටිනාකම</u><br>රු: |
|---|---|
| විකුණුම් ආදායම | **3050 000** |
| ආපසු එවුම් | **50 000** |
| අමුද්‍රව්‍ය පිරිවැය | **1500 000** |
| ශ්‍රම පිරිවැය | **500 000** |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | **585 000** |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | **60 000** |
| අලෙවි පොදුකාර්ය පිරිවැය | **67 000** |
| පරිපාලන පොදුකාර්ය පිරිවැය | **14 000** |
| ණය පොලී | **10 000** |
| ක්ෂය වීම | **11 000** |
| ආදායම් බදු | **15 000** |

…………………… ව්‍යාපාරය

…………………… දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| විකුණුම් ආදායම<br>අඩු කළා : වැට් බදු | | |
| ශුද්ධ විකුණුම් ආදායම<br>අඩු කළා:<br>මුළු සෘජු පිරිවැය | | |
| දළ ලාභය | | |
| අඩු කළා:<br>• නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය<br>• අලෙවිකරණ පොදුකාර්ය පිරිවැය<br>• පරිපාලන පොදුකාර්ය පිරිවැය | | |
| ක්‍රියාකාරී ලාභය | | |
| අඩු කළා:<br>• ක්ෂය වීම්<br>• ණය පොළී | | |
| බදු පෙර ශුද්ධ ලාභය | | |
| අඩු කළා:<br>• ආදායම් බදු | | |
| බදු පෙර ශුද්ධ ලාභය/ මෙහෙයුම් ලාභය | | |

...................

................. දිනට ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| අයිතමය | පිරිවැය | සමුච්චිත | ධාරණ |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම්<br>මෝටර් රථ<br>යන්ත්‍ර හා උපකරණ<br>ලී බඩු හා උපකරණ<br>වෙනත් | | | |
| මුළු ජංගම නොවන වත්කම් | A | | |
| ජංගම වත්කම්<br>මුදල්<br>(මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අවසාන ශේෂය)<br>අවසාන තොගය | | | |
| මුළු ජංගම වත්කම් B | | | |
| මුළු වත්කම් A + B | | | |
| වගකීම්<br>ජංගම වගකීම්<br>.................<br>තිබේ නම් පමණක් C | | | |
| ජංගම නොවන වගකීම්<br>..............................<br>(තිබේ නම් පමණි) D | | | |
| ව්‍යාපාරයේ යෙදවුම් (ප්‍රාග්ධනය )<br>ශුද්ධ ලාභය | | | |
| මුළු යෙදවුම් E | | | |
| මුළු වගකීම් C + D + E | | | |

විභාග ප්‍රශ්න :

**2018/11/(8)/(iv)**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු දෙකක් දක්වා ව්‍යාපාරයක මුදල් ගලා යාමට අදාළ අයිතම තුනක් ලියන්න.**

**2018/11/(8)/(v)**

සමන් දැනට කරගෙන යනු ලබන ව්‍යාපාරයට අමතර ව ගොවිපලක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා ව්‍යාපෘති වාරතාවක් සකස් කිරීමට ඔබට බාර දී ඇත. එම ව්‍යාපෘති වාර්තාවේ සාරාංශය තුළ ඔබ විසින් ඇතුළත් කරනු ලබන්නේ මොනවාදැයි සඳහන් කරන්න.

## <u>මූල්‍ය වාර්තා විශ්ලේෂණය</u>

ගිණුම් කාලච්ඡේදය අවසානයේ සකස් කරන මූල්‍ය වාර්තාවල අන්තර්ගත තොරතුරු ඇසුරින් ඇගයීම මූල්‍ය වාර්තා විශ්ලේෂණය ලෙස හැඳින් වේ.


❖ (අ) මූල්‍ය වාර්තා විශ්ලේෂණයෙ දී භාවිත කරන මිනුම් දඬු වර්ග දෙක නම් කර කරන්න.

1. ....................................................
2. ....................................................

(ආ) ඉහත එක් එක් වර්ගයට අයත් මිනුම් වර්ග නම් කරන්න.

.......................................  ..........................................................
.......................................  ..........................................................
.......................................  ..........................................................
.......................................  ..........................................................
.......................................  ..........................................................

▪ සමච්ඡේදන ලක්ෂ විග්‍රහය




විභාග ප්‍රශ්න:

2017/1/(50)

ව්‍යාපාරයක ශක්‍යතා අධ්‍යයනයක දී අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර හතරක් සඳහන් කරන්න.

## විධායක සාරාංශය

- ව්‍යාපාර සැලැස්මක ඇතුළත් මූලික කරුණු සංක්ෂිප්ත කොට දක්වන කොටස විධායක සාරාංශය වේ. ව්‍යාපාර සැලැස්මක් පරිශීලනය කර පුද්ගලයෙකුට ව්‍යාපාරයේ වැදගත් ම කරුණු සාරාංශගත ව ඉදිරිපත් කිරීම මෙහි දී සිදු වේ. ව්‍යාපාර සැලැස්ම  පරිශීලනය කරන පුද්ගලයකු විධායක සාරාංශයක් කිය වූ පසු එම ව්‍යාපාර සැලැස්මේ අන්තර්ගත කරුණු මගින් ව්‍යාපාරය ගැන විග්‍රහයක් ඔහුගේ මනසේ  නිර්මාණය වීමට සමත් වන පරිදි විධායක සාරාංශය ඉදිරිපත් කළ යුතුය.බාහිර පාර්ශව ඉලක්ක කරගත් ව්‍යාපාර සැලැස්මක ඉතා ම වැදගත් කොටස විධායක සාරාංශය වේ.
- විධායක සාරාංශයක මූලික පරමාර්ථය බාහිර පාර්ශව තවදුරටත් ව්‍යාපාරය පිළිබඳ ව සොයා බැලීමට පෙලඹවීම වේ. විධායක සාරාංශය සැම විටම කෙටි හා ආකර්ශණීය විය යුතුය.

විධායක සාරාංශයක වැදගත්කම :

- විධායක සාරාංශය සමස්ත ව්‍යාපාරය පිළිබඳව පෙර දැක්මක් ඇතිකරීම.
- ව්‍යාපාර සැලැස්ම පිළිබඳ ව මඟපෙන්වීමක් ලබා දීම.
- ව්‍යාපාර සැලැස්ම පිළිබඳ ව විශ්වාසයක් ඇති කිරීම.

විධායක සාරාංශයක අඩංගු කරුණු

- ව්‍යාපාරිකයාගේ නම හා ලිපි යොමුව
- ව්‍යාපාරයේ ඉතිහාසය
- ව්‍යාපාරයේ දැක්ම, නිෂ්ඨාව , ඉලක්ක හා පරමාර්ථ
- නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩය හෝ සේවාව
- තරඟ කිරීමට සිදුවන වෙළෙඳපොල
- ව්‍යාපාරය සාර්ථක කිරීමටත්, තරඟකාරිත්වයේ වාසි අත්වීමට හේතු
- ප්‍රධාන කළමණාකරණ කණ්ඩායම්
- මුළු ආයෝජනය - ව්‍යාපාරිකයා යොදන ප්‍රමාණය
- අපේක්ෂිත ණය ප්‍රමාණය

# <u>විධායක සාරාංශය</u>

- ව්‍යාපාරයේ නම :...........................................................................
- අයිතිනරුගේ නම :1.........................................................................
  2.........................................................................
- ලිපි යොමුව : 1.........................................................................
  2.........................................................................
- ව්‍යාපාරයේ දැක්ම : ......................................................................

- මෙහෙවර ප්‍රකාශය :
  ....................................................................................................
  ....................................................................................................
- මුළු ආයෝජනය :
  ....................................................................................................
  ....................................................................................................
- නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩය / සේවාව :
  ....................................................................................................
  ....................................................................................................
- තරඟ කිරීමට සිදුවන වෙළඳ පොල :
- ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම :

- මුළු ආයෝජනය :
  පවතින : ..............................................................................................
  යෝජිත : ..............................................................................................
- ආයෝජිත බැංකු ණය : .........................................................................

- 2019/1/(30)

ව්‍යාපාර සැලැස්මක පිළිබඳ මගපෙන්වීමක් ලබා දීම සඳහා පිළියෙල කරනු ලබන සාරාංශය වන්නේ,

(1) විධායක සාරාංශයයි. (2) පිරිවැය සාරාංශයයි. (3)මුදල් ප්‍රවාහ සාරාංශයයි.
(4) ආදායම් සාරාංශයයි. (5) ණය පිළිබඳ සාරාංශයයි.

Home work :

පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතන කිහිපයකි.

- ලියුම් කවර නිෂ්පාදන ආයතනය
- සිමෙන්ති ගඩොල් නිෂ්පාදන ආයතනය
- පාසල් නිල ඇඳුම් නිෂ්පාදන ආයතනය
- දැව අල්මාරි නිෂ්පාදන ආයතනය

ඔබ කැමති ව්‍යාපාර ආයතනයක් තෝරා ගෙන අදාළ තොරතුරු යොදා ගනිමින් පහත සැලසුම් පිළියෙල කරන්න.

1. අලෙවිකරණ සැලැස්ම
2. මෙහෙයුම් සැලැස්ම
3. මානව සම්පත් සැලැස්ම
4. මූල්‍ය සැලැස්ම
5. විධායක සාරාංශය

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."